# මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය

மகாவலி ,கமத்தொழில், நீர்ப்பாசனம் மற்றும் கிராமிய அபிவிருத்தி அமைச்சு

**Ministry of Mahaweli, Agriculture, Irrigation and Rural Development**

## ජාතික පොහොර ලේකම් කාර්යාලය

## தேசிய உரச் செயலகம்

## National Fertilizer Secretariat

නො. 288, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය, ශ්‍රී ලංකාව.
இல. 288, ஸ்ரீ ஜயவர்தனபுர மாவத்தை, ராஜகிரிய, இலங்கை.
No. 288, Sri Jayawardenepura Mawatha, Rajagiriya, Sri Lanka.


| | | |
|---|---|---|
| මගේ අංකය. / எனது இல. / My No. — 7 /1/2/3/4/NFP | ඔබේ අංකය. / உமது இல. / Your No. — | දිනය. / திகதி. / Date. — 2020.03. 31 |

**විශේෂ දැනුම් දීමයි**

සියළුම බලපත්‍රලාභී පොහොර සමාගම් වෙත,

**<u>කොරෝනා වසංගත තත්ත්වය යටතේ පොහොර විධිමත්ව බෙදා හැරීම</u>**

පොහොර ආහාර නිෂ්පාදනය සහ ආහාර සුරක්ෂිතතාවය සඳහා අත්‍යාවශ්‍ය සාධකයක් වන බැවින් පොහොර නිෂ්පාදනය හා ගොවීන් වෙත ආරක්ෂිතව බෙදා හැරීම “Covid- 19” වසංගත තත්ත්වය යටත් සිදු කල යුතු අත්‍යාවශ්‍ය කාරණයක් ලෙස රජය මගින් ප්‍රකාශයට පත් කර ඇත.

ඒ අනුව පොහොර නිෂ්පාදනය කරන සමාගම් හා බෙදා හරින සමාගම් ඊට අදාල කාර්යයන් සියල්ලම සීමිත කාර්යය මණ්ඩලයක් යොදවා ගෙන, සේවකයන් අතර “Covid- 19” වසංගත තත්ත්වය ප්‍රචාරණය නොවීම සඳහා අවශ්‍ය සියළු ආරක්ෂණ පහසුකම් යටත් කාර්යයන් පවත්වා ගත යුතු වේ. පොහොර අපනයනය, රේගු නිෂ්කාෂණයන් හා වෙළඳ අනුමැතීන් ඉල්ලුම් කරන අවස්ථාවේදී විද්‍යුත් තැපැල මගින් ලබා දීමට කටයුතු කරනු ලැබේ.

තවද, පොහොර බෙදා හැරීම සඳහා ප්‍රාදේශීයව එම සමාගම යටතේ ලියාපදිංචි වී ඇති නියෝජිතවරුන් ගේ වෙළඳ ස්ථාන ගොවීන්ට පොහොර මිලදී ගැනීමට හැකි වන පරිදි විවෘත කර තබා ගැනීමට ඔබ විසින් දැනුම් දිය යුතුය. එමෙන්ම මේ සමග විද්‍යුත් තැපැපෙන් එවනු ලබන දැන්වීම එම පොහොර වෙළඳසැල් වල අලවා ලැබීමට උපදෙස් දිය යුතුය.

එමෙන්ම පොහොර ප්‍රවාහනය කිරීම සඳහා ප්‍රධාන වෙළඳපොළට එළවළු ප්‍රවාහනය කරන ලොරි රථ යොදා ගැනීමට හැකි අතර ඔබ සමාගමේ හෝ නියෝජිතයන්ගේ හැරුණු විට වෙනත් ලොරි රථ ඒ සඳහා යොදා ගන්නේ නම් , ඒ සඳහා සුදුසු අවසරය ලබා දීමට ජාතික පොහොර ලේකම් කාර්යාලයේ දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂවරුන් වෙත මෙමගින් බලය පවරනු ලබේ. මෙම ලිපිය සමග දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂවරුන්ගේ දුරකතන නාමාවලිය ඔබ වෙත විද්‍යුත් තැපැලෙන් එවන අතර මෙම ලිපිය www.aginfo.lk වෙබ් අඩවියට උඩුගත (upload) කර ඇති බව කාරුණිකව දන්වමි.


ලේකම් / செயலாளர் / Secretary — දුරකථන / தொலைபேசி / Telephone - 011-2879048; ඊ-මේල් / மின்னஞ்சல் / e- mail - secretary@agrimin.gov.lk; ෆැක්ස් / தொலைநகல் / Fax - 011-2863497

කාර්යාලය / அலுவலகம் / Office — දුරකථන / தொலைபேசி / Telephone - 011-2872093, 011-2872097; ඊ-මේල් / மின்னஞ்சல் / e- mail - info@agrimin.gov.lk; ෆැක්ස් / தொலைநகல் / Fax - 011-2868910


Scanned with CamScanner

තවද මෙම ලිපිය අවශ්‍ය මහජන සේවාවක් අඛණ්ඩව සැපයීම, මෙහෙයවීම හා පසු විපරම පිණිස වූ ජාතික වැඩසටහන මැයෙන් අග්‍රාමාත්‍ය ලේකම්වරයා විසින් නිකුත් කල 2020.3.28 දිනැති චක්‍රලේඛ අංක PTF/01 අනුව ඇඳිරි නීති කාලය තුලදීද වලංගු වන බව කාරුණිකව සලකන්න.

මහේෂ් ගම්මම්පිල
අධ්‍යක්ෂ
ජාතික පොහොර ලේකම් කාර්යාලය

මහේෂ් ගම්මම්පිල
අධ්‍යක්ෂ
ජාතික පොහොර ලේකම් කාර්යාලය

පිටපත්

1. අග්‍රාමාත්‍ය ලේකම්
2. ලේකම්, මහවැලි , කෘෂිකර්ම , වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන අමාත්‍යාංශය - කා.දැ. ගැ. පි.
3. සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් - කා.දැ. ගැ. පි.
4. පොලිස්පති - ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව- කා.දැ. ගැ. පි.
5. ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්- කා.දැ. ගැ. පි.
6. කම්කරු කොමසාරිස් ජනරාල් - කා.දැ. ගැ. පි.
7. සියළුම ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/සහකාර කොමසාරිස්වරුන් - කා.දැ. ගැ. පි.
8. ජාතික පොහොර ලේකම් කාර්යාලයේ සියළුම අධ්‍යක්ෂවරුන් - අදාල පරිදි කටයුතු කිරීමට

Scanned with CamScanner